ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 ඔක්තෝබර් 06 සඳුදා
06 වෙළුම - 47 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## කතෝලික සසුන් දයා සේවයේ නිර්මාතෘ
## සා. විසෙන්ති ද පාවුලා මුනිතුමා

Lama Pradeepaya

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# කතෝලික දයාසේවාවේ පුරෝගාමී භාග්‍යවන්ත ෆෙඩ්රික් ඔසානම් තුමා

## ආදරණීය දුවේ පුතේ...

භාග්‍යවත් ඇන්ටොයින් ෆෙඩ්රික් ඔසානම් 1813 අප්‍රේල් 23 වැනිද ඉතාලියේ මිලාන් හිදි ජීන් සහ මාරි ඔසානම් යුවළට දව උපත ලැබීය. මිලාන් සිට ප්‍රංශයේ ලියොන් කරා ගිය ඔසානම් පවුල එහි සිටියදී කතෝලික විශ්වාසය ගැන සැක පහළ කළ අවදියක් විය. නීතිය හැදෑරීමට ගිය පසු පුවත්පත් කලාවට සිත යොමු වූ ඔහු ඒ ඔස්සේ කතෝලික පුවත් පතට ලියන්නට විය. 1833 මැයි මසදී දයා සේවාව ව්‍යාප්ත කරනු සඳහා තරුණ පිරිසක් සමඟ සාන්ත විසෙන්ති පාවුලා සමිතිය පිහිටවූහ.

කෙසේ වෙතත් පුවත්පත් කලාවට මහත්සේ ඇළුම් කළ ඔසානම් තරුණයා, 'කැතලික් ට්‍රිබියුන්' නම් ප්‍රංශයේ දිනපතා ජාතික පුවත් පතට ලිපි සපයන්නට විය. ඒ ඔස්සේ තවත් තරුණ පිරිසක් කැටුව 'යහපත් අධ්‍යාපනයේ සංගමය' මැයෙන් කාලීන තොරතුරු සංවාද මංඩපයක් ආරම්භ කළ අතර පසු කලෙක එය ඉතිහාසය ගවේෂණය කරන බුද්ධිමය මංඩපයක් ලෙස සිසුන් විශාල පිරිසක් අතර ප්‍රචලිත වන්නට විය. බයිබලයේ දැක්වෙන සමාජ දර්ශනය හා ඉගැන්වීම් කෙරේ, ඔසානම් ඇතුලු පිරිසගේ අවධානය යොමුවූ අතර එක් රැස්වීමකදී කතෝලික සභාව ක්‍රිස්තුන් වහන්සේ පිහිටුවා ලූ සභාව යැයි තර්ක කරද්දී ප්‍රතිවාදී පිරිස් ඔබේ සභාව අද කරන්නේ කුමක්ද? පැරීසියේ දිළිඳුන්ට කතෝලික සභාව කරන්නේ මොනවාද? ඒ බැව් ක්‍රියාවෙන් පෙන්නු විට අප විශ්වාස කරන බවට අභියෝග කැරිණ.

1833 මැයි මාසයේ දී අභියෝගය ජයගනු සඳහා ෆෙඩ්රික් ඔසානම් තවත් තරුණයන් අට දෙනකු සමග සාන්ත විසෙන්ති පාවුලා දයාසේවා සමිතිය පිහිටුවිය. ඉන් විසිවසරකට පසු පෙඩ්රික් ඔසානම් සගසුව දිනද්දී එහි සාමාජිකත්වය දෙදහස දක්වා ඉහළ නැග තිබිණ. දැන් භාග්‍යවරයට ඔසවා ඇති ගරු රොසාලි රෙන්ඩු පැව්දි සොයුරියගේ මහපෙන්වීම තුළ සිය දැක්ම හා ක්‍රමවේදය සකස් කර ගන්නට ඔසානම් සමත්විය. පැරීසියේ මුඩුක්කු පෙදෙස්වල සේවාවේ නියැළි මෙතුමිය සමග එරට කොළරාව වසංගතය පැතිර ගිය වකවානුවේ දී විසෙන්ති පාවුලා සමිති සාමාජිකයෝද අත්වැල් බැඳ ගත්හ.

1836 දී නීති උපාධිය දිනු අතර 1838 දී එතුමාගේ නිබන්ධනයකට ආචාර්ය උපාධිය හිමිවිය. 1839 දී වෙළෙඳ නීතිය පිළිබඳ මහාචාර්ය වරයා ලෙස පත්වු අතර 1840 විසිහත්වන වියේදී ප්‍රංශයේ සෝබෝන් විශ්ව විද්‍යාලයේ විදේශ සාහිත්‍යය පිළිබඳ සහකාර මහාචාර්ය වරයා විය. එහි දී ජර්මානු සාහිත්‍ය පිළිබඳ නව පාඨමාලාවක් සකස් කිරීමට අත්දැකීම් ලබා ගැනීම සඳහා එතුමා ජර්මනියටද ගියේය.

එකල සෝබෝන් විශ්ව විද්‍යාලයේ පැවැතියේ දැඩි ක්‍රිස්තු විරෝධි පරිසරයක් වූ අතර සිසු සිසුවියන් පමණක් නොව කටිකාචාර්ය මංඩලයද එහිලා දයක වූහ. යුරෝපා ශිෂ්ඨාචාරය ගොඩනැගීමට කිතු දහම පුරෝගාමී වූ අන්දම ඉතා ව්‍යක්ත ලෙස පෙන්නා දුන් ෆෙඩ්රික් ඔසානම් කිතුදහමේ මුලික වටිනාකම් රෝපණය කිරීමේ වැදගත් කම තහවුරු කළේය.

1841 දී ලියොන් සරසවියේ අධිපති තුමාගේ දියණිය වූ අමිලි සෞලා ක්‍රොයිස් සමඟ විවාහවු අතර ඒ විවාහයෙන් ලද දියණිය මාරි නම් වුවාය. 1848 දී ඇරඹි ප්‍රංශ විප්ලවයේදී ඔහු පුවත්පත් වලට ලිපි ලිවේය. විසෙන්ති පාවුලා සමිති පිහිටුවීමටත්, ඒවා ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යෑමටත් දිස්ත්‍රික්කයක් පාසා ගියේය.

1853 සැප්තැම්බර් 8 වැනිද එතුමා සග සුව දිනීය. එතුමාගේ හොඳහිත හා දිළිඳුන් කෙරේවූ ඇල්ම නිසා වෘත්තීමය වශයෙන් වූ ඉහළ තත්ත්වය පරයමින් දිළිඳුන්ට සමීප විය. එතුමා ඇරැඹූ සාන්ත විසෙන්ති පාවුලා දයා සේවාව මේ වන විට මුළු ලොව පුරා පැතිර ඇති අතර එතුමාව 1997 අගෝස්තු 22 වැනිද සාන්ත දෙවන ජුවාම් පාවුළු මුනිතුමන් විසින් භාග්‍යවරයට ඔසොවන ලදී. භාග්‍යවන්ත ෆෙඩ්රික් ඔසානම් තුමාගේ මංගල්‍යය සැප්තැම්බර් 27 වැනිදට යෙදී තිබිණ.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

ශිරාන් මෛත්‍රී
ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක

# ආදර මරි මව්නි

මෙම ලිපියෙන් බෙදා ගන්නට මා අදහස් කළේ ඔබ තුමීයගේ ජීවිත කාලය තුළදීම මා අත්දුටු උතුම් ගුණාංගයක් පිළිබඳවයි. ඔබ තුමීය වෙනුවෙන් මෙවන් වූ උතුම් වසරක් ප්‍රකාශයට පත් කොට ඇති කාල වකවානුවක එය කලෝචිත වනු ඇතැයි මගේ විශ්වාසයයි. ''මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි'' ඔබ පැවසූ ලෙසට මට ඉටු වේවායි.'' (ලුක් 1:38) මේ තමා මා අත්දුටු ඔබතුමියගේ ජීවිතයේ උතුම්ම ගුණාංගය. දේව කැමැත්තට මුළු ජීවිතයම නතු කිරීම ඒතුළ අනාගතය පිළිබඳව ඔබ තුමිය තුළ කිසිදු බියක් සැකක් හෝ චකිතයක් තිබුණේ නැත. ඒ තුළින් මුහුණ දීමට සිදුවන ප්‍රතිවිපාක ගැන පේන බැලුවේද නැත. අද අපගේ වචනයෙන් පවසනවා නම් ''සියල්ලේ අයිතිය '' දෙවියන්ට දුන්නා. වචනයේ පරිසමාප්තියෙන්ම එය යථාර්ථයක් බවට ඔබතුමීය පත්කලා.

ඔබ තුමීයගේ මව්තුරුගේ උණුසුම ලබන දරුවන් ලෙස අපද මේ දේම කිරීමට සෑම දිනයකම වෙර දරන්නෙමු. නමුත් ආදර අම්මේ, ඒ කැමැත්තට නතු වෙද්දී කොහේ හරි තැනක පොඩි බයකුත්, අනාගතය පිළිබඳ පොඩි සැකයකුත් නිරන්තරයෙන්ම ගොඩ නැගෙන්නෙමු. මෙහෙම වුනොත් මොනවා වෙයිද? කොහොමද මම මුහුණ දෙන්නේ? වැනි අප විසින්ම නිර්මාණය කර ගත් ප්‍රශ්ණ වැලක් අප ඉදිරියේ දිග හැර ගන්නෙමු. ඇයි අපිටම මෙවැනි දෑ සිදුවන්නේ? යනුවෙන් නිගමන වලට පවා අප එළඹෙන්නෙමු. අවසානයේ අප නොදැනීම ලස්සන වචන ගොන්නක් තුල අතරමං වෙලා සියල්ලේ අයිතිය දෙවියන්ට දීමට නොහැකිව මා විසින්ම මවා ගත් ඔබව රවටන වෙස් මුහුණක් පළඳවාගත් බාහිර චත්පිළිවෙත් වලට පමණක් සීමාවූ භක්තිවන්තකම ජීවත්වන චරිතයක් බවට මා පරිවර්තනය වෙලා. ඒවිට ඔබගේ කැමැත්තට නතු වෙනවාට වඩා මගේ පැවැත්ම වෙනුවෙන් මා නොකරන කිසිවක් නොමැති තරම්ය. අසාධාරණය, සාධාරණය හා වැරැද්ද

නිවැරැද්ද හරහා බොරුව ඇත්ත හරහා අපිම ගොඩ නගා ගත් අපටම අවේනික තීන්දු තීරණවල ඇලී ගැලී සිටින්නෙමු.



ආදර අම්මේ, ඔබ සියල්ලේ අයිතිය දෙවියන්ට දුන්විට ඔබතුළ රෝපණය වූ බැහැපත්කමේ හා නිහඬ බවේ ඵලය ඉතා මනරම්ය. එය ඇඳහිය නොහැකිය. ගවමඩුවේ සිට කුරුස ගස දක්වාම එය මානාව විද්‍යාමාන විය. මා මාගෙ න්ම ප්‍රශ්න කරමි. මගේ දේව කැමැත්ත තිරණය වන්නේ මට ලැබෙන මිල මුදල මතද? මා දරණ තනතුරු තුළද? මා ජය ගන්නා ප්‍රශ්න අරගල තුළද? මට වැටහුණි. ඒ තුළින් උපදින ඵලය බැහැපත්කම නොව අබිමානයයි. නිහඬබව නොව නිරතුරුවම නොසන්සුන් බවයි. මගේ අනාගතය පිළිබඳ සැකයයි.

ආදර අම්මේ ජීවිතයේ සම්පූර්ණ අයිතිය දේව කැමැත්ත තුළ ඔබ දුන් දෙවියන්ට ලබා දීමට අප සැවොම මෙහෙය වූව මැනව. ශතවර්ෂ ගණනකට මත්තේන් එය සැබෑවක් කළ ඔබ තුමීය අද අපගේ ජීවිත වලද එය සැබෑවක් බවට පත්කල මැනව. ඔබතුමීය දේව කැමැත්තට හිස නමා සියල්ලේ අයිතිය දෙවියන්ට ලබා දුන්නාසේම අපටද බියෙන් සැකයෙන් තොරව ඒ කැමැත්තට නතුවන්නට ශක්තිය ලබා දුන මැනව.


**රුවන් මංජුල - නිට්ටඹුව**

## දේව අම්මා

ජිවිත ගමනේ ඔබ වින්ද දුක් අපමණය
නමුත් එම දුක් කරදර සියල්ල
නුඹ සිතෙහි නිධන් කර ගත්තා නොවෙද
කතකගෙ වටිනාකම ලොවට පහදා දුන්නෙත් නුඹයි
සියළුම කතුන්ගේ අග රැජිණියද නුඹයි
මා ජිවිතය ආලෝකවත් කළ මිණි පහනද නුඹයි
සඳ ඔබ සළු සෙවනෙහි අප රැකගත මැන
ආදර දෙව් මව්නි......

**තිළිණි ලක්ෂාණි**
දේව සංරක්ෂණයේ දියණියන්ගේ කන්‍යාරාමය - පලගතුර

# ජපමාලයේ හාස්කම



පුංචි ඩෙනිස් දේව මෑණියන්ට හරිම ආදරෙයි. මේ පුංචි දරුවා පූජාවට ප්‍රථම දේවස්ථානයට ගොස් දිව්‍ය පූජාවට කලින් මුළු ජපමාලයම කියලා තමයි දිව්‍ය පූජාවට සහභාගි වන්නේ. ඩෙනිස්ගේ අම්මා කඩයප්පන් විකුණලා තමයි පුංචි ඩෙනිස්වයි, එයාගේ තාත්තවයි රැකගන්නේ. ඒ ඇයිද දන්නවද? ඩෙනිස්ගේ තාත්තා ලෙඩ වෙලා ඇඳේ ඉන්නේ ළඟක ඉඳලා දෑත් වෙව්ලන්න ගත්තා. වෛද්‍යවරුන්ටපෙන්නලා බෙහෙත් කලාට කිසිම සුවයක් නැහැ. ඩෙනිස්ගේ අම්මා එයාගේ තාත්තාව ඇඳ මත හාන්සි කරවලා කන බොන දේ අතට දුන්නම එයා තනියම කාපු දෑත් දැන් වෙව්ලන නිසා ඩෙනිස්ගේ අම්මාට වගකීම තවත් වැඩි වුනා. ඒ කියන්නේ එයාගේ තාත්තාට කවන්නත් සිද්ධ වුනා.

මේ අතරේ ''මරිය වසර'' වෙනුවෙන් කුඩා දරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් තිබුනා. ජපමාලය දෑතින් අල්ලාගෙන කෙලෙසද යාච්ඤා කරන්නේ කියලත් කියලා දුන්නේ දේවස්ථානයේ පියතුමා. උන්වහන්සේට මරිය තුමිය අත් දැකපු දෙවලුත් මේ අතර කියැවුණා. මේ වැඩ සටහනට පුංචි ඩෙනිසුත් සහභාගී වුනා. ඒ විතරක් නොවේ . ඩෙනිස් තම නිවසට ඇවිල්ලා සවස හයට ඉස්සරින් ගේ දොර අතුගාලා අස්පස් කළා. පසුව යාච්ඤා කරන තැනට කට්ට කුමන්ජල් දුම අල්ලලා පහන පත්තු කරලා ගිය අවුරුද්දේ දිව්‍ය සත්ප්‍රසාදය ප්‍රසාද නිධානය ලබපු වේලාවේ දී එයාට හම්බ වෙච්ච ජපමාල දෙකක් සුරක්ෂිතව අරන් තියලා තිබ්බා. එක ජපමාලයක් පුංචි ඩෙනිස් පාවිච්චි කළා. අනිත් ජපමාලය තම පියාගේ වෙව්ලන දෑතට දීලා මෙහෙම කිව්වා. ''මගේ තාත්තේ මං ඔයාට මේ ජපමාලය දෙන්නේ ඔය දිග හරින්න බැරි ඇඟිලි වලින් පුළුවන් විදිටය මා එක්ක ජපමාලය කියන්න'' කියලා පුංචි ඩෙනිස් තම මව ඇමතුවා. ''අම්මේ මං ජපමාලය පටන්ගන්නවා''. ''හොඳයි මගෙ පුතේ මම කුස්සියේ ඉදගෙනම කියන්නම්'' කියලා කිව්වේ. ඉදියප්පන් ඕඩරයක් ඇවිල්ලා ඒකට එයා මහන්සි ගන්න අතර තුරුම ඩෙනිස්ගෙ යාච්ඤාවෙන් හවුල් වුනා. මේ ලෙස දින ගණනාවක්ම තම පියා මව එකතු වෙලා ජපමාලය යැද්දා. ඉරිදා දිව්‍ය පූජාවට ගොස් පුංචි ඩෙනිස් තම පියාට දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට අවශ්‍ය බව ගරු පියතුමාට සැලකර සිටියා. දිව්‍ය පූජාවට සහභාගි වීමට පැමිණි ''ඩොක්ටර් වාසනාත් '' පැමිණි සිටි නිසා මේ බව ඇසුනු සැණින් ඩොක්ටර් වාසනා මෙහෙම කිව්වා. ''ෆාදර් මේ ඩෙනිස්ගේ තාත්තාව බලන්න මටත් ආසයි. මගේ වාහනේම ෆාදර්වත් රැගෙන යන්නම් කියලා ඇය මැදිහත් වුනා.

පුංචි ඩෙනිස් තම මවත් පියතුමත් සමඟ ඩොක්ටර් වාසනාගේ වාහනයට නැඟගත්තා. තම නිවසට ගරු පියතුමා ගොඩ වෙන්නත් කලින් ඩෙනිස් දුවලා ගිහින් තරමක් අබලන් වූ පුටුව පියතුමාට ඉඳගන්න සුදානම් කළා. ඩෙනිස්ගේ පියා නැඟිටලා හිටින්න උත්සාහය දරද්දී පියතුමා එය වැළකා මෙහෙම කිව්වා. ''ඔහොම ඉන්න ඔහොම ඉන්න මං ළඟට එන්නම්'' කිව්වා. ඒ වෙන කොට ඩෙනිස්ගේ තාත්තා ජපමාලය කියමින් සිටියේ. දිව්‍ය සත්ප්‍රසාදය දනය කරපු පියතුමා කටයුතු අවසන් කරලා දෙඩ මළු වෙන්න ගත්තා.

''මට ඩෙනිස් කිව්වේ එයාගේ තාත්තාගේ ඇඟිලි දිගු කරන්න, නවන්න බැහැ. වේව්ලනවා කියලයි'' ඩොක්ටර් වාසනා ඒකට එකතු වුනේ මෙහෙම කියාගෙන, ''ෆාදර් ඇඟිලි වලට ව්‍යායාම අවශ්‍යයි'' කියලා. ඩෙනිස්ගේ අම්මා නම් කිව්වේ, දොස්තරලා කීප දෙනෙක්ම ඉස්පිරිතාලේ වෙද කම් කලත් නමුත් හරි ගියේ නැහැ කියලයි.

''ඉතින් කොහොමද ඩෙනිස්ගේ තාත්තේ.... ආ මේ හොඳට ඇඟිලි වැඩ කරන්නේ'' පියතුමා කිව්වා. එහෙයි පියාණෙනි අද කට්ටිය පල්ලියට යන කම් ඉදල මං ජපමාලය උච්චාරණය කරමින් හිටියේ.'' පුංචි ඩෙනිස්ටත් එයාගේ අම්මාවත් පුදුමයට පත් කරමින් ඩෙනිස්ගේ තාත්තා ඇදට බරදීලා කොට්ටයට ඔළුව තියාගත්තා. ෆාදර් මාගේ තාත්තාට ජපමාලය කියන්න මමයි දුන්නේ හරි පුදුමයි ඇඟිල් වේව්ලන්නේ නැහැනේ දැන්''. ''ඔව්මයි හරි පුදුමයි'' බලන්නකෝ, ''ඩොක්ටර් වාසනා බලන්නකෝ ඩෙනිස්ගේ තාත්තාට හරි අඩක් සුවයි. ඒ වගේම එයාගේ ඇඟිලිවලට ව්‍යායාමය තමයි ජපමාලය මැතිරීම'' පියතුමා කිව්වේ, ඩොක්ටර් වාසනා දෙසට හැරිලයි. ඩෙනිස්ගෙයි එයාගේ අම්මයි, තාත්තාගෙයි ඇස්වටල සතුටු කඳුළු රූරා හැලුනා. ඇත්තමයි මරිය උත්තමාවියගේ අනුහසින් තමා මෙයාට සුවය ලැබුනේ. කියලා ඩෙනිස්ගේ අම්මා කිව්වා.

**ජූඩ්. ජේ. ප්‍රනාන්දු මාමා**

## ළමා ලේඛක වැඩමුළු

### රත්නපුර පදවිය

රඹුක්කන සා. ආලෝසියස් දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2014 ඔක්තෝබර් 12 වන දින එම දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු රොෂාන් තිසේරා (පැ.තු.නි.) පියතුමාගේ අදහසකට අනුව දහම් පාසලේ ආචාර්ය මඩුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කරයි.



උස්වැටකෙයියාව සා. මරියා දහම් පාසලේ ළමුන් 68 ක් පසුගියදා ප්‍රථම වරට දිව බොදුන් ලැබීය. මීසම් සේවක ගරු නොයෙල් සම්පත්, ගරු පැට්‍රික් සොයුරියන් හා ළමුන් පුහුණු කල ගුරු මෑණිවරුන් සමඟ දිව බොදුන් ලැබූ ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ඒ.ජේ.ඒ. අබේනායක**

## පළමු වරට දිව බොදුන් ලැබීම



රද්දොලුගම මීසමට අයත් රද්දොලුව, කොටරූපේ සහ රද්දොලුගම යන දහම් පාසල්වල ළමෝ 29 ක් රද්දොලුගම ලූර්දු මාතා දෙව්මැදුරේදී පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙයෙන් අනතුරුව ළමුන් ගරු ජයන්ත වික්‍රමසිංහ, මීසම් සේවක ගරු දෙව්ශාන් අසංක පියතුමන්ලා සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**රන්ජිත් ලොකුපෝතාගම**

**මාසික සිතිවිල්ල**



**"ඔක්තෝබර් මාසය"**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

සේයා :-
**අශේන් එස්. සේනාරත්න**

## මාසික සිතිවිල්ල - ජයග්‍රාහී නිර්මාණය

දෙවිඳුන්ගෙන් ලද තිළිණයක් වූ ළමා විය
තාක්ෂණික ක්‍රීඩා පැතිකඩයක වහලෙක් වීලා,
සෙල්ලම් ගෙයක් අද තනියම පාළු වෙලා.
වැලි සෙල්ලම ළමා වියෙන් අමතක වීලා.
වැලි සෙල්ලම තාක්ෂණයේ ගොදුරක් වීලා.
පුංචි මල්ලී නුඹ යම් දිනයක
පණ දෙනු ඇත වැලි සෙල්ලම් බතට යළිත්....

ඩිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු
සා. පියෝ කනිටු දෙව්සත්හල - පල්ලන්සේන

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## තෙවන තේමාව :- දේව පනත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතයක්

## තෙවන තේමාව යටතේ පළවු ප්‍රශ්න සඳහා පිළිතුරු

**කාම මිත්‍යාචාරය නොකරන්න , පරදාර ආලය නොකරන්න.**

18.
★ නිල් චිත්‍රපටි බැලීමට හුරුවීම ★ ළමා අපයෝජන
★ මත්ද්‍රව්‍ය භාවිත කිරීම ★ අනියම් සබඳතා පැවැත්වීම
★ අසභ්‍ය පුවත්පත් බැලීම ★ සමලිංගික ඇසුරක් පැවතීම

19. ★ සිත කය හා වචනයේ පිවිතුරුකමට විරුද්ධ දෙයින් වැළකීමට ය.

20. ★ භයවන

21. ★ ඇයගේ වයස අවුරුදු 12 දී ඇගේ පියා මරණයට පත් විය. පසුව ඇය මව සමඟ බාල සහෝදරියන් රැක බලා ගෙන නිවසේ සම්පූර්ණ වගකීම භාර ගත් බව.

★ දෙවියන් වහන්සේට දැඩිසේ ආදරය කරමින් උන්වහන්සේ කෙරෙහි අචල විශ්වාසයකින් කටයුතු කළාය. එසේම බාල සහෝදර සහෝදරියන්ට දේව ආදරය ගැන ඉගැන්වීම

★ මෙලෙස ඇය වැඩෙන විට අධ්‍යාත්මිකව මෙන්ම ශාරීරිකවද වඩාත් ශක්තිමත් වුවාය.

★ දිනක් ඇය ගෙදර සිටින විට එක් පව්ටු පුද්ගලයෙකුගේ (ඇලෙක්සැන්ඩර්) අදහසට එකඟ නොවීම නිසාත් ඔහුට තදින් විරුද්ධව වීම නිසා ඔහු ඇයට මාරාන්තික තුවාල සිදු කිරීම

★ මරණයට පෙර මරියා තම මෑණියන්ට පැවසුවේ ''අම්මේ මම පළමුවරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ දා ජේසුට දුන් පොරොන්දුව ඉටු කළා. මරණයට පත් වුවත් මා දේව ජීවිතය නැති කරගන්නේ නැහැ'' යන්නයි. එසේ ප්‍රකාශ කරමින් ජීවිතයේ තම පිරිසිදුකම ආරක්ෂා කර ගනිමින් ඇය ස්වර්ග ස්ථ වුවාය.

**සොරකම් නොකරන්න අනුන් සතු දේ ආශා නොකරන්න.**

22. ★ 7 වන සහ 10 වන පණත්

23. ★ 7 වන සහ 10 වන පණත්

24. ★ අවංක වැඩ කිරීමෙන් ★ උරුම වශයෙන්

25.
★ අධික වෙහෙසීම නිසා ලෙඩ රෝග වැළඳීම
★ අනවශ්‍ය වියදම් ඇති වීම
★ අනිසි මිතුරන් ඇති වීම
★ උවමනාවන් වලට සීමාවක් නොවීම
★ පවුලේ සබඳතා බිඳී යාම

26. සාධාරණත්වය

27. 7 වන පනතට විරුද්ධව ක්‍රියා කර ඇත

28. ★ 7 වන පණත හා 10 වන පණත

**බොරු නොකියන්න**

29.
★ අල්ලස් ගැනීම හා දූෂණ ක්‍රියාවලින් වැලකී සිටීම
★ අනුන් නොමග යවන කතා නොකිරීමට ප්‍රවේශම් වීම
★ අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම

30. ★ සෑම අවස්තාවකදීම සත්‍යවාදිව ජීවත් වීමෙනි

31. ★ ආත්ම දමනය කළ යුතුය.

**ශුද්ධවු සභාවේ පනත්**

32. ★ ඉරුදනත් ණය මංගල්‍ය දිනත් දිව්‍ය පූජාවට සහභාගි වීම
★ අවුරුද්දකට වරක්වත් පාපොච්චාරණය කිරීම

33. ශුද්ධ වූ සභාවේ පණතකි.

**ආදර්ශ හා අනුමාන ප්‍රශ්න**

34.
★ දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට අගෞරව කිරීම
★ දෙවියන් වහන්සේගේ උතුම් නම කියා දිවිරීම
★ දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය බොරුවට පාවිච්චි කිරීම

35. ★ දෙවෙනි පණත නම් දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය බෝරුවටවත්, නිරන්තරයටවත් නොදිවිරව. මෙයට විරුද්ධව නොහැසිරෙන්න.

**ඉතිරිය ලබන සතියේ**

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# බයිබල් දැනුම මිනුම තරගාවලියේ දස්කම් පෑ බොරැල්ල සියලු සාන්තුවරයින්ගේ බාලිකා සිසුවියෝ



බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශයේ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා සා. ජෝශප් විද්‍යාලය එක්ව දෙවන වරට සංවිධානය කළ බයිබල් දැනුම මිනුම ජාතික තරඟාවලිය පසුගියදා මරදාන සා. ජෝශප් විදුහලේදී පැවැත්විණි.

සියලු සුදුන්ගේ විදු පියසෙන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන සියලුම මාධ්‍යයන් නියෝජනය කරමින් කණ්ඩායම් හතක් මෙහි කලාපීය තරඟයට සහභාගි වූ අතර එයින් කණ්ඩායම් පහක් ජාතික තරඟාවලියට සුදුසුකම් ලැබූහ.

එහිදී අන්තර් මධ්‍ය - ඉංග්‍රීසි , ප්‍රථම ස්ථානය, අන්තර් මධ්‍යම සිංහල - දෙවන ස්ථානය, ජ්‍යෙෂ්ඨ - ඉංග්‍රීසි දෙවන ස්ථානයද ලබා ගත් අතර සමාධි රත්නායක ශිෂ්‍යාව අන්තර් මධ්‍යම - සිංහල කණ්ඩායම් තරගයෙන් ඉහළ ලකුණු ලබා ගෙන රන් පදක්කමක්ද දිනා ගත්තාය. ජයග්‍රාහී සිසුවියන් සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්, විදුහල්පති ගරු ඈන් ක්‍රිස්ටින් , ළමුන් පුහුණු කළ ගරු සජීවනි හා ගරු රියානා (අ.කා.නි.) පැවිදි සොයුරියන් සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

## මීගමුව කලාපීය සමුහ ගායනා තරගාවලියේදී මුන්නක්කරය දහම් ළමුන්ගෙන් කැපීපෙනෙන දස්කම්

2014 කොළඹ අගරදගුරු පදවියේ මරිය වසරට සමගාමීව මීගමුව ධර්මෝපදේශ අපෝස්තලික සේවාව සංවිධානය කළ සමූහ ගායනා තරගයෙන් මීගමුව කලාපීය අවසන් මහා තරගයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගැනීමට මීගමුව මහවීදිය මීසමට අයත් මුන්නක්කරය සා. නිකුලා දහම් ළමෝ සමත්වූහ.

මෙහිදි වයස අවුරුදු 12,15 න් හා 18,න් පහල වයස් කාණ්ඩ තුනේදීම ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත්වීම කැපී පෙනෙන්නකි. මෙම දෙව්මැදුර භාර, මීසම් සහයක ගරු නලින් සුරාජ දහම් ගුරු මඩුල්ල හා දෙමාපියන් මෙම ළමුන්ගේ ජයග්‍රාහණයට විශාල දිරියක් ලබා දුනි.

**වින්සන් ප්‍රනාන්දු - ආචාර්ය මඩුල්ල**
**සා. නිකුලා දහම් පාසල - මුන්නක්කරය**

## පුංචි දුවේ

ඉස්කෝලේ යන්න එන්න
බැහැයි කියල අඩන
මගේ දුවේ .....

බැහැ අම්මේ පාරෙ යන්න
හරිම බයයි මං නැතිවෙයි........

එපා දුවේ බයවෙන්නට
පුංචි සිතත් දැඩි කරගෙන
ජීවිතයත් ජයගන්නට
සමිඳු යඳිමු සැම දිනේ .........



**ටයිටස් සපරමාදු මාමා**
**බෝපිටිය**

# ආධුනික ලේඛක ලේඛිකාවන් දොරට වැඩි ළමා ලේඛක වැඩමුළු






බෝලවලාන මීසමට අයත් උළුඅම්බලම ක්‍රිස්තු රාජ දහම් පාසලේ 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා දෙව්මැඳුරු ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුයේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මීසම් සේවක ගරු සුජීව අතුකෝරල පියතුමාගේමඟ පෙන්වීම යටතේ දහම් පාසලේ විදුහල්පති, ආචාර්ය මණ්ඩුල්ල එක්ව මෙය සංවිධානය කළ අතර, මේ අවස්ථාවට මීසම් සහයක ගරු තිළින ප්‍රනාන්දු පියතුමා සහභාගි විය. ඥානාර්ථ ප්‍රදීපය ලේඛක රන්ජන් පල්ලේවෙල මහතා මෙම වැඩමුළුවේ සම්බන්ධිකාරකලෙස කටයුතු කළේය.

**රුවන් තිසේරා**







ගම්පහ සිරිකුරුස විදුහලේ 7 ශ්‍රේණියේ සිට ඉහළ සිසුවියන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා විදුහල් ශාලාවේදී පැවැත්වුණි. මෙය මෙහෙයවුයේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව විදුහල්පතිනි ගරු මේරී දීපානි (අ.ක.නි) පැවිදි සොහොයුරියගේ අනුශාසකත්වයෙන්, ගරු පැවිදි සොයුරියන්, ආචාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍ය නායිකාවන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කෙරිනි. මීට එක්වූ ළමුන්ට ජනසංනිවේදනය, පුවත්පත් කලාව හා නිර්මාණ කරණය පිළිබඳව දැනුම්වත් කළ අතර ලේඛක අභ්‍යාසයක්ද ලබා දී එහි සාර්ථක නිර්මාණ ළමා ප්‍රදීපය පුවත්පතේ පළ කිරීම ළමුන්ට ලැබුණු විශේෂ අවස්ථාවකි.

**නිම්නාදි රුදිගු**
13 ශ්‍රේණිය - **සිරිකුරුස විදුහල - ගම්පහ**

# ගම්පහ සිරි කුරුස විදුහලේ දක්ෂ ලේඛිකාවියෝ

## මා දිවියේ හිරු සඳු

ඔබේ කරුණා සාගරයේ කිමිදෙන්න
ඔබේ ආදර අඹරේ මට පියඹන්න
නිමක් නැති ඔබේ සෙනෙහේ දැවටෙන්න
පරසතු මල් පුදා පැතුවෙමි සැමදාම

දස මස කු හොවා සිටියා නොව අම්මේ
ඔබේ රත් රුහිරු කිරි කෙරුවා නොව අම්මේ
ඔබේ රන් දෙනෙයනෙන් මා රැකුවා අම්මේ
හිරුත් සඳුත් මා දිවියේ ඔබමය අම්මේ

**ලක්දිනිති සුබසිංහ**
**10 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල - ගම්පහ



## අම්මා

ආදරේ ගුණය සොයා නිමකළ පිළිරුව අම්මා
ආදරේ වැඩි වු නිසා රතු ලේ සුදු කිරි කළ අම්මා
මා නිසි ලෙස හැදු වැඩු අම්මා
මා වෙනුවෙන් දහඩිය දා කඳුළු සැලු අම්මා

**මන්දාකිණි ප්‍රනාන්දු**
**6 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල - ගම්පහ

## උදෑසනක අසිරිය

කළු සේලයෙන් වැසී තිබු අහස් තලය
එළියවුණා හිරුකුමරුගේ කිරණින්
අඳුර දුරුවුණා ළහිරු කිරණෝ බලයෙන්
උදා වුණා නව දිනයක්
මල් කැකුළු විකසිත වී
සිහින් සුළං රොදක් හමායාවී
විකසිත වූ කුසුම් වල
සුවඳ හොරෙන් රැගෙන යාවී
නිසසල මේ උදයේ ........

**සජානි තත්සරණී**
**09 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල - ගම්පහ

## රෑ අහස

රන් තරුකැට බබලනා
සඳ කුමරා දිලිසෙනා
ලොවම මඟුල් ගෙයක් වැනා
රෑ අහසයි දිදුලනා

හඳහාමි අවදිවෙයි
තරු කැට නිවි නිවි දිලෙයි
මුළු ලොව නිදි කරයි
රෑඅහසත් හරි පුදුමයි

**ප්‍රසාදි පෙරේරා**
**08 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල - ගම්පහ

**වැඩමුළුවක ප්‍රතිඵලයක්**



**හිරුණි නේහා**
**07 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල
ගම්පහ

## හොඳ ලේඛිකාවක් වෙමු.



නිවැරදි දේ පමණක් සැමවිට තෝරාගෙන
හොඳ පොත් පත් පුවත් පත් සැමවිට බලමින
නිවැරදි දේට පමණක් සිත යොමු කරමින
හොඳ ලේඛිකාවක් විය හැකි මේ අයුරින

ආගම දහමටත් අපගේ සිත යොමු කරමින්
එදිනෙදා සමාජයේ සිදුවන දේටත් අප සිත යොමු කරමින්
යහපත් දේට පමණක් රූපවාහිනියට නෙත් යොමු කරමින්
හොඳ ලේඛිකාවක් වෙමු රට ආගමට සැම විට ගෞරව කරමින්

**තරුෂි ඉමායා**
**7 ශ්‍රේණිය** - සිරිකුරුස විදුහල - ගම්පහ



**හිරුදිමලි ද සිල්වා**
**09 ශ්‍රේණිය**
සිරිකුරුස විදුහල
ගම්පහ

# Unknown Catholic Saints

## St Gregory the Great

### *Feast Day - (September 3)*



piope Gregory's 'story is as well-known as that of any saint. Even among the non-religious his use of puns is celebrated. He famously said of two blond-haired slave boys in Rome that they were "not Angles, but angels", and their sight inspired him to send St Augustine to the Kingdom of Kent where, in part thanks to the pressure of his overbearing .wife, King Ethelbert accepted baptism in 597.

Gregory's impact went beyond bringing the Angles, Saxons and Jutes within the Church in a region that a Northumbrian monk would one day call "England".

Born in 540, during the very darkest of the Dark Ages, Gregory was among that select band of men and women (among them Benedict) who would lay the foundation of a new civilisation built on Greece and Rome's legacy but around the vision of Jesus Christ.

A prolific writer, a Doctor of the Church and one of the Latin Fathers, Gregory was known as "the father of Christian worship" for the next millennium. Among Orthodox Christians he is called St Gregory the Dialogist. Even John Calvin admired him, calling him "the last good pope". He was also the first pope from a monastery, reflecting the increasing influence of the monastic movement.

As a child, Gregory may have witnessed the re-capture of Italy by Emperor Justinian, who threw the Goths out of Italy in 552 and then repulsed the Franks in 554, after which there was peace in Italy. (Yet the Plague of Justinian, which killed a third of the Italian population, was a bigger cause of misery than any barbarian.) Gregory was born into a wealthy Roman family that had close ties to the Church. His great-great-grandfather was Pope Felix III and the family owned land on the Caelian Hill, now the Via di San Gregorio, opposite the former palaces of the emperors on the Palatine Hill (by that time total ruins).

An exceptional student, he had great admiration for the monastic life, three of his aunts being nuns, although the youngest caused by a scandal by abandoning the religious life. Gregory's response has lasted the ages: "Many are called but few are chosen." In 579 he was chosen as an ambassador to the imperial court in Constantinople where his main task was secur-ing help against the Lombards; the Byzantines, as it was, had enough problems with the Slavs.

He left for Rome in 585, returning to his monastery on the Caelian Hill before being elected Pope in 590, Pelagius having succumbed to the plague. The papacy had lost control of much of western Europe by this point, with Gaul overseen by local families, the Spanish bishops cut off from Rome and Italy itself overwhelmed by barbarians. Gregory was determined to spread the Gospel, sending missions to Germany, the Low Countries and, most famously, Britain.
Gregory wrote more than 850 letters in the last 13 years of his life and also standardised western plainchant, which therefore became known as Gregorian.

# මාංශගතවීමේ අභිරහස සහ භාග්‍යවන්ත දේව මාතා වහන්සේ.



ශුද්ධ වූ කතෝලික සභාව මාර්තු මස 25 වන දින ගාබ්‍රියෙල් අග්‍රදූතයා භාග්‍යවත් දේවමාතා වහන්සේට මංගලම් කීමේ මංගල්‍යය මහත් සොම්නසින් යුතුව සමරන්නීය. මෙම මංගල්‍යය සැමරීම තුළින් අපි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධ ප්‍රධාන අභිරහසක් මෙනෙහි කරමු.

එය "මංශගත වීමේ අභිරහස" යැයි අපි හඳුන්වමු. අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය හා දිව්‍ය පූජා යාගයේදි යොදු ගැනෙන නිසියානු විශ්වාස ලක්ෂණයේ ඒ අභිරහස අපි පැහැදිලිව ප්‍රකාශ කරමු. එය සෑම කතෝලිකයෙකු විසින්ම පිළිගතයුතු හා විශ්වාසයෙන් ප්‍රකාශ කළ යතු විශ්වාසයේ සත්‍යතාවයකි.

"මොහු ස්ප්‍රීතු සාන්තු විසින් ගැබවැස කන්‍ය මරියතුමියගෙන් උපන්නාහ." (අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය) "ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභවයෙන් කන්‍ය මරියාවන්ගෙන් මිනිස් බව ගෙන උන්වහන්සේ මනුෂ්‍යයා වූ සේක." (නිසියානු විශ්වාස ලක්ෂණය)

- මාංශගතවීමේ අභිරහස යනු කුමක්ද?

මාංශගතවීම → මාංශයට ඇතුළු වීම ( මසට ඇතුළුවීම)

| කවුද? | කොතැනකදිද? | කොහොමද ? | කුමකටද ? |
|---|---|---|---|
| WHO? | WHEN? | HOW ? | FOR WHAT? |

ශුද්ධවූ ත්‍රිත්වය දෙවන තැනැන්වහන්සේ වන දේව පුත්‍රයාණන් වහන්සේ එනම් ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් කන්‍ය මරියතුමියගේ කුස තුළ පිළිසිඳ ගැනීම "මංශ ගතවීමෙ අභිරහසයි" (Incarnation) කෙටියෙන්ම සාරංශගතව කියතොත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වීමයි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මංශගතවීම සිදුවුයේ ගාබ්‍රියෙල් අග්‍රදූතයා දේවමාතා වහන්සේට මංගලම් කී අවස්ථාවේදී එතුමිය දේව දූතයාගේ වචනය එනම් දේව වචනය සිය හදවතින්ම පිළිගත් මොහොතේදිය. එම දේව වචනය ශුද්ධාත්මාණන් වහන්සේගේ විශේෂ සහයෝග යෙන් කන්‍ය මරියතුමියගේ කුස තුළ එතුමියගේ මාංශයට හා රුධිරයට තදින් සම්බන්ධිතව මනුෂ්‍ය ජීවයක් ඇති කරනු ලැබීය. ඒ පිළිබඳව "Lumen Gentium" නම් වු සාන්ත සභාව පිළිබඳ දෙවන ජගත් වතිකාන කතිකාවතේ ධර්ම ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වේ.

"සුරදූතයාගේ පණිවිඩය ලත් සැණින් අප කන්‍යාවන් දේව වචනය ඇගේ හදවතට හා ජීවිතයට ලබා ගනිමින් ලෝකයටද ජීවනය ලබා දුන් සේක. මෙතැන් පටන් ඉදිරියට ඇය සැබවින්ම ගැලවුම්කරුවාණන්ගේ මාතාවන් හා දේව මාතාවන් බවට ගෞරවාන්විතව පිළිගැනුනු සේක. තම පුතුණුවන්ගේ විශිෂ්ටත්වයට පංගුකාර වීම කිට්ටුවන්ත වීම හා බිඳලිය නොහැකි සේ උන්වහන්සේ හා බැඳීම තුළ ලබා ගත් උත්කෘෂ්ඨ වූද සුවිශේෂිත වූද කැඳවීම නිසාම දේව පුතුණුවන්ගේ මව වීමේ මහත් වූ ආශිර්වාසයකට හා අති උසස් තැන්හී වූ මහිමයකටද ඔසවනු ලැබීමට එතුමිය වරම් ලද්දීය. (ලුක් 53)

ශු. පාවුළු අපෝස්තුළුතුමා පිලිප්පිවරුන්ට ලියු ලිපියේ ක්‍රිස්තුස් වහන්සේගේ මිනිසත් බව ගැනීම ඉදිරිපත් කරන්නේ මෙසේය. "උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත් දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදුගෙනම තබා ගත යුතු වස්තුවකැයි නොසිතා තමන් වහන්සේවම ත්‍යාජ කර ගනිමින් වහලෙකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිස් කෙනෙක් වු සේක. (පිලිප්පි 2/6)

ලබන සතියට.......

දිනේෂ් පෙරේරා - දළුගම

## හා. ජුසේවාස් පියතුමා

**සහන්‍යා දෙව්මිණි**

04 ශ්‍රේණිය

ශු. ප්‍රැන්සිස් අසීසි
දහම් පාසල
උඩුගම්පල
බුරුල්ලපිටිය මීසම



## ශ්‍රී ශරීරය හා රුධිරය

**කව්දු රශ්නික**

03 ශ්‍රේණිය

මාරිස්ටෙල්ලා
විදුහල
මීගමුව






## දේව මාතාවන් වහන්සේ

**ෂෙහාරා සචිනි**

08 ශ්‍රේණිය

සා. නිකුලා දහම් පාසල

මුන්නක්කරය ( මහවිදීය මීසම)



## දිය ඇල්ලක්

**සචිදු හේෂාන්**

06 ශ්‍රේණිය

ක්‍රිස්තුරාණන්ගේ
දහම් පාසල
උළුඅම්බලම
බෝලවලාන
මීසම

# පුංචි අපේ චිත්‍ර පිටුව

## පොල් ගස්

**සිත්මල් උදන**

04 ශ්‍රේණිය

ලොයොලා විදුහල

බෝපිටිය






## පියකරු උදෑසනක්

**අමල්ජා බර්නඩීන්**

05 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල - ගම්පහ

# ශු. සබ්බාස් මුනිතුමා



සුදුවර චරිතයක් හඳුනාගනිමු

ක්‍රි.ව. 439 දී කපිදෝසියාවේ කයිසාර් මැස්කාර් හි උපත ලැබූ මෙතුමා මිලිටරි නිළධාරියෙකු වූ අතර ජොන් හා සොෆියාගේ පුත්‍රයෙකි. ස්වකීය දේශපාලනික හා ආරක්ෂිත පියවරක් ලෙස ඇලෙක්ස්සැන්ඩ්‍රියාවට යැවූ මෙතුමා තම මාමා කෙනෙකු යටතේ වසර 05 ක් විසු අතර වයස අවු 08 දී අන්තියෝකියානු රදගුරුතුමන් යටතේ වූ තාපසාරාමයට ඇතුළු වූ අතර එහිදී ශු ලියවිල්ල හා සුභාරංචිය ගැඹුරින් අධ්‍යනය කිරීමට මෙතුමාට හැකිවිය. වසර ගණනා වක් මෙහි නියුතුව දේවධර්මය හා දර්ශණවාදය මැනවින් අධ්‍යනය කල අතර, සිය දෙමාපියන්ගේ මතය වූයේ ඔහු නැවත පෙරළා තම ගෘහය වෙත පැමිණ විවාහ දිවියට ඇතුළත් විය යුතු බවයි.

වයස අවු 17 දී තම කෙස් මුඩු කොට දැඩි තාපස යෙකු ලෙස ජෙරුසලමට ආ අතර මෙහිදී මෙතුමාට මහා එනිමියුස්ඩ තුමන්ව මුණගැසුණි. මේ නිසා මෙතුමාගේ දිවිය තුල ආධ්‍යාත්මික දිවිය මනා වර්ධනයක් වූ අතර, වනගත ගුහාවක් ආශ්‍රිතව දැඩි භාවනායෝගී තාපස දිවියක් ගත කිරීමට මෙතුමා උත්සහ කළේය. කල්‍යත්ම මෙතුමා වටා පිරිස් ද ඒකරාශි වන්නට වූ අතර ඔවූහු ලෞකීක දිවිය පසෙකලා පලස්තීනයේ ජෙරුසලමට දකුණු දෙසින් කිද්‍රෝන් වල පිහිටි නිම්නයේ ඔවූහූ තම තාපසාරාමය පිහිටුවා ගත්හ.

මේ තාපසාරාමයෙන් බිහිවූ ප්‍රබල වැසියන් ලෙස ශු ජොන් දමස්කස් මුනිතුමාද හැදින්වේ. මෙම තාපසාරාමය මුල සිටම ග්‍රීක ආභාෂය හා සංස්කෘතික පදනම තුළ පෙරදිග ආභාෂය ලත් තාපසාරාමයක් විය. පසුකාලීනව මෙකී තාපස දිවියට සවිමත් පදනමක් දැමු මෙතුමා ඒ සදහා නීතිමාලාවක් ද පනවන ලදි. මේ නිසා විවිධ ප්‍රදේශ වල තාපසාරාම අරඹන්නට මෙතුමාට හැකිවිය.

මේ නිසා අනනේනියස් අගරජුට හා ජස්ටින් අගරජු සහ කුළුපගු මිත්‍රත්වයක් ඇති කිරීමටද මෙතුමා හැකිවිය. ක්‍රි ව 532 දෙසැම්බර් 05 වන දින මෙතුමා ස්වර්ගස්ථ වූ අතර ශු සභාවෙ මෙතුමාගේ මංගල්‍යය දෙසැම්බර් 05 වන දින සමරනු ලැබේ. කුරුස යුද්ධය සමයේදී මෙම තාපසාරාමය විනාශ වූ අතර මෙතුමාගේ ශු. ධාතු ඉතාලියට ගෙන ගොස් 1965 දී VI වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා නැවත වරක් කිදොන් නිම්නයේ තාපසාරාමයට මෙම ශු ධාතු භාර දුන් අතර මහළු ශුද්ධවත් තාපසයා යන ආදර නාමයෙන් මෙතුමා නම් කරනු ලැබේ.

**අසේල දසනායක**






සන්තානා ළමා නිවාසයේ (ස.ළ.නි.) 21 වන උපන් දින සැමරුම පසුගියද තුම්මෝදර ළමා නිවාසයේදී පැවැත්වුණි. හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මේ සඳහා ගරු පියතුමන්ලා ඇතුළු බොහෝ පිරිසක් සහභාගි වූහ.

තුම්මෝදර, ලුණුවිල හා දෙමන්හංදිය නිවාසයන් හී ළමෝ මෙදින විශේෂාංග ඉදිරිපත් කළහ. සළනි නිර්මාතෘ ගරු ෆ්‍රැන්ක් තිසේරා පියතුමන්ගේ මගපෙන්වීම යටතේ මෙම උත්සවයේ කටයුතු සංවිධානය කෙරෙති. **(කුමර නයනජිත්)**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි.
මෝසෙස්
69
කථාව, දෙබස්, චිත්‍ර - චාලිත - සපු ආරච්චිගේ
මෝසෙස් ඔබ කානාන් දේශය ඇතුලට යවපු දොළොස් දෙනාගෙන් කීප දෙනෙක් අසනීපවී මැරී වැටුනා.....
ඔව්... එහෙමද..?
මෝසෙස් අපි කානාන් දේශය ඇතුලට ගොස් ඇවිත් ඔබට කීවේ සත්‍ය තොරතුරුයි... මේ මැරුණු අය ඔබට බොරු කීවා...
මිනිසුනේ දැක්කාද දෙවියන් වහන්සේට බොරු කාපු අයට වූ.. දේ.. ඔය... මිනිස්සු
කානාන් දේශය ගැන අසත්‍ය තොරතුරු කීව් කිහිප දෙනා අසනීප වී මළේය... ඔවුන්ගේ සිරුරු වළලදැමූ ඔවුන්...
මෝසෙස් අපි දැන් කානාන් දේශය අල්ලගනිමු.. අපි දැන් ඔවුන් හා.. සටනට යමු...
ඔව්.. ඔව්.. මෙහෙම බඩගින්නේ.. යන්න එන්න..
..එක හොඳයි...
..අපි වැරදිකාරයෝ ..අපි සටන් කර... ..මැරෙමු...
මාගේ මිනිසුනේ..නුඹලා සටනට යන්ට එපා.. දෙවියන් වහන්සේට... අකීකරුවූ නිසා නුඹලා ට දෙවියන්ගේ පිහිට... ලැබෙන්නේ නැහැ..... එනිසා මා කියනදේ.. අසාපල්ලා.. ඔය.. සටනට යන්න එපා..
නැහැ.. අපට මෙහෙ බඩගින්නේ, පිපාසෙ මැරෙන්ට.. අපි ඔවුන් හා.. සටනට යනවා.. සටනින් අප මියයයි.. එක අපට සැපයි...
මෝසෙස් කී දේ ඔවුන් ඇසුවේ නැත ඔවුන් කානාන් දේශයෙ සිටින පිරිස් සමඟ සටන් වැදුණේය
හේයි..
කානානීය පිරිසගෙන් ඊශ්‍රායලීවරුන්ට දරුණු පරාජයක් අත් විය...

# ප්‍රහේළිකා අංක 47



## හරහට

1. සපීරා නම් තම භාර්යාව සමග ඉඩමක් විකුණා මුදලෙන් කොටසක් තබාගෙන ඉතිරි කොටස පමණක් ප්‍රේරිතයන් වෙතට ගෙන යාම නිසා මරණය හිමි කර ගත්තේ මොහුය.

4. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වූ අවස්ථාවේදී, අහස අඳුරු වී දේව මාළිගාවේ ............ දෙකඩව ඉරී ගිය බව ශුද්ධ ලියැවිල්ලේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. දේව මාළිගාවේ ''සුදර්ශන'' දොරටුව අසල සිටි කොරාට කතා කළ පේදුරු තුමා ''...........වත් රිදීවත් මට නැත. මට ඇති දේ ඔබට දෙමි. නාසරෙත්හි ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්නැ''යි කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

7. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින්, ලෝකයේ සියළු රට රාජ්‍ය පෙන්වා යක්ෂයාට වඳින්නේ නම් ඒවායේ ........................ ඉසුරු ක්‍රිස්තුන් වහන්සේට දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

8. ගල්ගසා මරා දැමීමට ක්‍රිස්තුන් වහන්සේ වෙතට පව්කාර ස්ත්‍රීයව රැගෙන ආ විට උන්වහන්සේ''ඔබ අතරින් .........ක් නැති තැනැත්තේ පළමු ගල ගැසුවාවේ''යි ප්‍රකාශ කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

## පහළට

1. ක්‍රිස්තියානි යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදී බව ශුද්ධ බයිබලයේ ක්‍රියා පොතේ සඳහන් වෙයි.

2. නරකාදිය යන වචනයට සමාන වචනයකි.

3. ගල් ගසා මරා දමන ලද, ප්‍රථම ප්‍රාණ පරිත්‍යාග වරයායි.

5. ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදා ගැනීම සඳහා මෝසෙස් තුමා පාරාවෝ .......... ඉදිරියේ පෙනී සිටියේ ය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ක්‍රිස්තුන් වහන්සේ නොයෙකුත් ලෙඩ රෝග වලින් පීඩිතව සිටි අයව ........කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4,23 ක්‍රියා 11,3 ශු. ජුවාම් 8

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා ඔබේ නම, ශ්‍රේණිය , පාසල, දහම් පාසල , ලිපිනය සඳහන් කර තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 47, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

## කොරළවැල්ල දිව බොදුන් ලැබූ ළමුන්ගෙන් ආදර්ශමත් ක්‍රියාවක්



කොරළවැල්ල මීසමේ දිව බොදුන් ලැබූ ළමෝ 27 ක් තමන්ගේ මර්දන ක්‍රියා තුළින් ඉතුරු කර ගත් මුදලින් සපයා ගත් වියලි ආහාර ද්‍රව්‍ය අසරණ පවුලකය පරිත්‍යාග කළහ. ඊට සුදනම් වූ අවස්ථාවයි මෙහි දිස්වේ. **ක්‍රිස්ටි ප්‍රදීනාන්දු**

## ළමා ප්‍රදීපය 06 වන සංවත්සරය ......

ආදර දුවේ පුතේ ළමා ඔබේ පුවත් පත ''ළමා ප්‍රදීපය'' ඔක්තෝබර් මසදී සිය 06 වන උපන් දිනය සමරනු ලබයි. ළමා ප්‍රදීපය 06 වන සංවත්සර කලාපය සඳහා ළමා ඔබේ නිර්මාණ හා සුබ පැතුම් 2014 ඔක්තෝබර් මස 13 වන දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

**ළමා ප්‍රදීපය 06 වන සංවත්සර කලාපය**

**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08**

**සංස්කාරක පියතුමා**

# ගරු තිස්ස බාලසූරිය පිය පරිගණක මධ්‍යස්ථානය විවෘත වේ

ළමා ප්‍රදීපය
















පසුගියදා මට්ටක්කුලියේ ඉදිකළ ගරු තිස්ස බාලසූරිය පිය පරිගණක මධ්‍යස්ථානය විවෘ ත කරන ලදි. දරු දැරියන් හට නොමිලේ පරිගණක අධ්‍යාපනය ලබාදීමේ ව්‍යාපෘතියක් ලෙස ඉදි වූ මෙම නව පරිගණක මධ්‍යස්ථානය විවෘත කිරීමේ උළෙලට නිමල මරිය නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු රොහාන් සිල්වා පියතුමා නි.ම.නි සහ මරදාන සමාජය හා සාමයික කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ගරු නීතිඥ අශෝක් ස්ටීවන් නි.ම.නි. පියතුමන්ද සහභාගී විය.

**සටහන : තිළිණ අලහකෝන්**

# ‘සෙනෙහෙබර කැදැල්ලකට ගැයෙන ගී’ මොරගොඩදී













මොරගොඩ මීසමේ තරුණ සමිතිය හා පියතුමන් එක්ව සංවිධානය කරන ලද ‘සෙනෙහෙබර කැදැල්ලකට ගැයෙන ගී’ ප්‍රසංගය හෝරා දෙකක් පුරා මොරගොඩ ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේ එළිමහන් රංග පීඨයේදී පැවැත්විණි. ගරු දෙව්ශාන් අසංක පියතුමන් ප්‍රමුඛ ගායන කණ්ඩායම විසින් මෙම ප්‍රසංගය මෙහෙයවනු ලැබීය.

**සටහන : තිළිණ අලහකෝන් / සේයා : තාරක මුණගමගේ හා නිපුණ රංගික**